ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය
ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

2020 ඇසළ පොහොය දින සැමරීම සඳහා, කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය 2020 ජූලි මස 3 වන දින ප.ව. 5ට ශ්‍රී ලාංකික සහ ඉන්දියානු විද්වතුන්ගේ සහභාගීත්වයෙන් අන්තර්ජාල සම්මන්ත්‍රණයක් සංවිධානය කර තිබිණ. බුදුන් වහන්සේගේ “සබ්බෙ සත්ථා භවන්තු සුඛිතත්තා” එනම් “සියලු සත්වයෝ සුවපත් වෙත්වා, නිදුක් වෙත්වා” යන පණිවිඩය වෙත විශේෂ අවධානයක් යොමු කරමින්, “ගෝලීය යහපැවැත්ම සඳහා ධර්මය” යන තේමාව යටතේ මෙම සම්මන්ත්‍රණය පැවැත්විණ.

බුදු දහම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින වැදගත් ශිෂ්ටාචාරමය බැඳීමකි. අද දින නව දිල්ලියේ පැවති ධර්ම චක්‍ර දින සැමරුම අමතමින් අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා ප්‍රකාශ කළේ ලෝකය අසාමාන්‍ය අභියෝගයන් හා සටන් කරමින් සිටින බවයි. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් මෙම අභියෝගයන් සඳහා තිරසාර විසඳුම් ඉදිරිපත් කරන බව එතුමා පෙන්වා දුන්නේය. මෙම විසඳුම් එදා, අද මෙන්ම හෙටත් වලංගු වන බවද එතුමා ප්‍රකාශ කළේය. අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද් ර මෝදි මැතිතුමා 2017 වසරේදී ශ්‍රී ලංකාවේ පැවති ජාත්‍යන්තර වෙසක් දින සැමරුම සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන්ද සහභාගී විය. මෙම පොදු බැඳීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය පසුගිය මාසයේදී පොසොන් පොහොය දින නිමිත්තෙන් ශ්‍රී ලාංකික චිත්‍ර ශිල්පීන්ගේ සිතුවමින් මහ කොමසාරිස් කාර්යාල තාප්පය අලංකාර කරමින් “පොසොන් පවුර” නමින් චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීය.

කැළණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ ප්‍රධානී පූජ්‍ය ගල්කන්දේ ධම්මානන්ද හිමි, සම්මානිත විද්වතෙකු වන සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද් යාලයේ සමාජ විද්‍යා මහාචාර්ය කලාශූරි ප්‍රණීත් අබේසුන්දර, සම්මානිත විද්වතකු

වන සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ බෞද්ධ අධ්‍යයනාංශයේ පීඨාධිපති සහ සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන අධ්‍යයන අංශයේ මහාචාර්ය සමන්ත ඉලංගකෝන් සහ සම්මානිත නවකතා සහ කාව්‍ය රචක දයා දිසානායක යන විද්වතුන් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මෙම සම්මන්ත්‍රණය සඳහා සහභාගී විය.

ඉන්දීය රජයේ, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ විශ්ව විද්‍යාලයක් සේ සැලකෙන නව නාලන්දා මහ විහාරයේ උප කුලපති ආචාර්ය වෛද්‍යනාත් ලාභ්, බරණාසි හින්දු විශ්ව විද්‍යාලයේ පාලි සහ බෞද්ධ අධ්‍යයනාංශයේ ප් රධානී මහාචාර්ය බිමලේන්ද්‍ර කුමාර් , කල්කටා විශ්ව විද්‍යාලයේ පාලි අධි යයනාංශයේ ප්‍රධානී මහාචාර්ය සාස්වතී මුට්සුඩ්ඩි සහ වියට්නාමයේ, හැනෝයි නුවර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට අනුබද්ධිත ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ සහ සම්මානිත ලේඛකයකු, කාව්‍ය රචකයකු සහ සංස්කෘතික ඉතිහාසඥයකු වන ආචාර්ය ජී . බී. හර්සිහා යන විද්වතුන් ඉන්දියාව නියෝජනය කරමින් මෙම සම්මන්ත්‍රණයට සහභාගී විය.

කොළඹ, ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ආචාර්ය රේවන්ත් වික්‍රම සිං මැතිතුමා පිළිගැනීමෙ කථාව සිදු කළේය . සම්මන්ත්‍රණය මෙහෙයවන ලද්දේද ඔහු විසිනි.

විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය විසින් මතු කර තිබෙන වර්තමාන අභියෝගයන් සැලකීමේදී ගෝලීය යහපැවැත්ම සඳහා බුදු දහමෙ වැදගත්කම මෙම විද්වතුන් විසින් සාකච්ඡාවට භාජනය කරන ලදී. ඇසළ පොහොය දින ඉන්දියාවෙ සාරානාත්හි බුදුන් වහස්සේ විසින් ප්‍රථම ධර්ම දේශනාව වන ධම්මචක්ක පවත්තන සූත්‍රය දේශනා කිරීමේ වැදගත්කම මතු කරමින් , එකිනෙකා වෙනුවෙන් කරුණාව දැක්වීමෙ අවශ්‍යතාවය විද්වතුන් විසින් අවධාරණය කරන ලදී. බුදුන් වහන්සේ දේශනා කළ පරිදි නිවැරදි කායික , වාචික සහ මානසික ක්‍රියාවන්ගෙන් පමණක් ගෝලීය යහපැවැත්ම තහවුරු කළ හැකි බව මෙහිදී පෙන්වා දෙන ලදී.

වසර 2500 කටත් වැඩි කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පවතින ගැඹුරු සමාජ-ආගමික, සංස්කෘතික සහ ඓතිහාසික සම්බන්ධතාවය විද්වතුන් අවධාරණය කළේය. ඇසළ පොහෝ දිනය මෙම සම්බන්ධතාවය වඩාත් ශක්තිමත් කළ වැදගත් දිනයක් බව මෙහිදී ප්‍රකාශ කෙරිණ . දේවානම්පිය තිස්ස රජුගේ ඥාති පුත්‍රයකු වන අරිට්ඨ කුමරු සහ තවත් 55 දෙනෙකු ඉන්දියාවේ අශෝක අධිරාජයාගේ පුත්‍රයාණන් වන මහින්ද මහ රහතන් වහන්සේ වෙතින් පැවිදි බව ලබාගනිමින් ලක්දිව සම්බුද්ධ ශාසනය පිහිටුවන ලද්දේ ඇසළ පොහෝ දිනකදීය. එසේම, ඉන්දියාවේ කාලිංග නුවර සිට ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවන ලද්දේද ඇසළ පොහෝ දිනකදීය.

කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට අනුබද්ධ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් මෙම සම්මන්ත්‍රණය සංවිධානය කිරීම පිළිබඳව විද්වතුන් සිය ප්‍රසාදය පළ කළෝය. එසේම, මෙවැනි සාකච්ඡාවන් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ විද්වතුන් අතර මෙන්ම ලෝකයේ වෙනත් රටවල විද්වතුන් සමඟ ද සංවිධානය කරන ලෙස ඔවුහු ඉල්ලා සිටියෝය.

කොළඹ, ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ නිල ෆේස් බුක් පිටුව ඔස්සේ මෙම සම්මන්ත්‍රණය සජීවීව විකාශය කෙරිණ.

****

කොළඹ
ශක වර්ෂ 1942 අශාඪ 14
2020 ජූලි 04